# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1950/40 - 2016 ජනවාරි මස 20 වැනි බදාදා - 2016.01.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**විනිමය පාලන පනත යටතේ දැන්වීම (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වන අධිකාරය)**

**විනිමය පාලන පනතේ 07 වන සහ 08 වන වගන්ති ප්‍රකාරව වූ අවසරය**

යම් තැනැත්තෙකු විසින් ඔහුගේ විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පතක් භාවිතයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුට විදේශ ව්‍යවහාර මුදල්වලින් ගෙවීම් කිරීම සඳහා විනිමය පාලන පනතේ (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වන අධිකාරය වූ) 7 වන සහ 8 වන වගන්තිවල කාර්ය සඳහා පහත දැක්වෙන නියමයන් හා කොන්දේසිවලට යටත්ව මෙයින් අවසර දෙනු ලැබේ.

1. ශ්‍රී ලංකාව තුළ නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුට විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පතකින් (EFTC) මුදල් ගෙවීම එම කාඩ්පත විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුමකට (FEEA), නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට (RFC), නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට (RNNFC) හා අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට (NRFC) එදිරිව නිකුත් කර ඇති අවස්ථාවක දී හැර පහත සඳහන් කාර්යයන් සඳහා පමණක් විය යුතු ය.

(අ) සංචාරක, නවාතැන්, වෛද්‍ය පහසුකම්, ජීවන හා අධ්‍යාපන වියදම් ඇතුළු පෞද්ගලික ස්වභාවයේ සේවා සඳහා කාඩ්පත් හිමියකු විසින් විදේශ රටවලදී මුදල් ගෙවීම ;

(ආ) පෞද්ගලික ප්‍රයෝජනය සඳහා විදේශ රටවලදී භාණ්ඩ මිලදී ගැනීම සඳහා මුදල් ගෙවීම ;

(ඇ) 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන ලද විධිවිධානයන්හි සඳහන් නියමයන්, කොන්දේසි හා සීමාවන්ට යටත්ව පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කිරීම සඳහා මුදල් ගෙවීම ;

(ඈ) විදේශීය වෘත්තිමය ආයතනයකට හෝ අධ්‍යාපනික ආයතනයකට ගෙවිය යුතු පෞද්ගලික ස්වභාවයේ ලියාපදිංචිවීමේ ගාස්තු, අමතර ඉගැන්වීමේ ගාස්තු, විභාග ගාස්තු සහ වාර්ෂික දායක මුදල් ගෙවීම ;


1A - G 23072 — 26 (2016/02)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඉ) පෞද්ගලික ස්වභාවයේ සංචාරක සහ සෞඛ්‍ය රක්ෂණ සඳහා පමණක් රක්ෂණ වාරික සම්බන්ධයෙන් මුදල් ගෙවීම ;

(ඊ) ශ්‍රී ලංකාවේ සිටින අතරතුර පෞද්ගලික ස්වභාවයේ විදේශ සංචාර හා නවාතැන් පහසුකම් සම්බන්ධයෙන් මුදල් ගෙවීම.

2. සුදුසුකම් ලත් පුද්ගලයින් තනි පුද්ගලයින් වන්නේ නම්, බලයලත් වෙළෙන්දෙකුගෙන් අයදුම් කර හර පතක් ලබා ගැනීමට පහත සඳහන් පුද්ගලයන්ට සුදුසුකම් ලැබේ.

(අ) රැකියාවක්, ව්‍යාපාරයක් හෝ වෘත්තියක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකව සිටින ශ්‍රී ලාංකික පුරවැසියෙකුට, එවැනි රැකියාවෙහි, ව්‍යාපාරයෙහි හෝ වෘත්තියෙහි නියැළෙන කාලය තුළ දී.

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථිරව වාසය කරන, අනේවාසික ආවෘත ගිණුමක් හෝ සංක්‍රමණික ආවෘත ගිණුමක් විවෘත කර ඇති ශ්‍රී ලාංකික පුරවැසියෙකු.

(ඇ) රාජ්‍ය දූත විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ රාජ්‍ය දූත රුපියල් ගිණුම් හිමියෙකු.

(ඈ) අනේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියෙකු.

(ඉ) නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම් හිමියෙකු.

(ඊ) විදේශීය ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ රුපියල් ගිණුම් හිමියෙකු.

(උ) සුරැකුම්පත් ආයෝජන ගිණුම් හිමියෙකු.

(ඌ) විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම් හිමියෙකු.

(එ) අන්තර්ජාතික සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ සේවකයන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, සේවා නියුක්තිකයෙකු ලෙස පවත්වාගෙන යන පුද්ගලයෙකු.

(ඒ) විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් හිමියෙකු.

(ඔ) නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියෙකු.

(ඕ) නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියෙකු.

(ක) අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියෙකු.

3. 2 ඡේදයේ අයිතම (ආ) සිට (ක) දක්වා ලැයිස්තු ගත කර ඇති තනි පුද්ගලයෙකුට හර කාඩ්පතක් නිකුත් කරනු ලබන අවස්ථාවක දී, එම ගිණුමේ බැරට ඇති මුදල් මත එකී හර කාඩ් පත නිකුත් කළ හැක.

4. 2 ඡේදයේ දක්වා ඇති පරිදි තනි පුද්ගලයෙකුට නිකුත් කර ඇති හර කාඩ්පතක් පහත දැක්වෙන නියමයන් හා කොන්දේසිවලට යටත්ව භාවිතා කළ යුතු ය ඃ

අ. ශ්‍රී ලංකාව තුළ දී ඕනෑම ගෙවීමක් ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීමට අවසර ඇත.

ආ. (i) රාජ්‍ය දූත විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ;
(ii) අනේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ;
(iii) සුරැකුම්පත් ආයෝජන ගිණුම් ;
(iv) විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම් ;
(v) විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් ;
(vi) නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ;
(vii) නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ;
(viii) අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්.

යන ගිණුම්වලට එදිරිව නිකුත් කරන ලද හර කාඩ්පතක් හරහා ඕනෑම කාරණයක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුට ඕනෑම ගෙවීමක් කිරීමට පොදු අවසරයක් ලබා දී ඇත.

ඇ. පහත සඳහන් තැනැත්තන්ට හර කාඩ්පත් නිකුත් කර ඇති අවස්ථාවලදී ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුට, ජංගම ජාත්‍යන්තර ගනුදෙනුවක් සඳහා ගෙවීමක් කිරීමට අවසර ඇත.

(i) සේවා නියුක්තිකයෙකු වශයෙන් පවත්වාගෙන යන අන්තර්ජාතික සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ සේවකයන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සේවා නියුක්තිකයෙකු ලෙස පවත්වාගෙන යන පුද්ගලයෙකු ;

(ii) රැකියාවක්, ව්‍යාපාරයක් හෝ වෘත්තියක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකව සිටින ශ්‍රී ලාංකික පුරවැසියෙකුට එවැනි රැකියාවෙහි, ව්‍යාපාරයෙහි හෝ වෘත්තියෙහි නියැළෙන කාලය තුළදී.

5. 2 ඡේදයේ අයිතම (අ), (ඒ), (ඔ), (ඕ) හා (ක) යටතේ විද්‍යුත් මුදල් හුවමාරු කිරීමේ කාඩ්පතක් නිකුත් කර ඇති අවස්ථාවකදී හැර, ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙකුට නිකුත් කර ඇති විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පතක්, කාඩ්පත් හිමියා වෙනත් රටකට විගමනය වන්නේ නම් හෝ විදේශ සේවා නියුක්තියක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව යන්නේ නම්, කාඩ්පත නිකුත් කළ බැංකුවට භාර දිය යුතු ය.

6. හර කාඩ්පතක් හෝ ණය කාඩ්පතක් භාවිතා කර විදේශ මුදල් ලබා ගැනීමේ අවස්ථාවකදී කාඩ්පත් හිමියා විසින් එසේ ගත් මුදල් භාවිතා කොට ඇත්තේ 1 ඡේදයේ සහ 4 ඡේදයේ අයිතම (ඇ) යටතේ අවසරලත් ගනුදෙනු සඳහා පමණක් බවට තහවුරු කළහැකි සාක්ෂි තබාගත යුතු ය.

7. ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුට විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පතක් හරහා ඕනෑම අවශ්‍යතාවයක් සඳහා ඉහත 1 ඡේදයේ සඳහන් අවශ්‍යතාවලින් පරිබාහිරව කරනු ලබන ගෙවීම් සඳහා විනිමය පාලකවරයාගේ පූර්ව ලිඛිත අවසරය අවශ්‍ය වන්නේ ය.

8. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම නිවේදනයේ කාර්යය සඳහා -

(i) "**බලයලත් වෙළෙන්දා**" යන්නට විනිමය පාලන පනතේ දී ඇති අර්ථයම අදාළ වනු ඇත.

(ii) "**විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත (EFTC)**" යන්නෙන් බැර, හර හෝ වෙනත් යම් ආකාරයක වටිනාකමක් මාරු කිරීම සඳහා භාවිතා කරන්නාට හැකියාව ලබා දෙන කාඩ්පතක් හෝ උපකරණයක් අදහස් වන අතර, එයට ණය කාඩ්පත්, හර කාඩ්පත් සහ විනිමය පාලන පනතේ විධි විධානයන්ට අනුකූල වන බවට බලයලත් වෙළෙඳුන් විසින් ගනුදෙනු විස්තර හඳුනාගත හැකි අවස්ථාවලදී වටිනාකම තැන්පත් කළ කාඩ්පත් ද ඇතුළත් වේ.

(iii) "**හර කාඩ්පත**" යන්නෙන් මුදල් ලබා ගැනීම සහ/හෝ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා එම කාඩ්පත දරන්නා විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම සෘජුවම හර කළහැකි කාඩ්පතක් අදහස් වේ.

(iv) "**ණය කාඩ්පත**" යන්නෙන් කාඩ්පත් දරන්නා වෙත එය නිකුත් කරන්නා විසින් ප්‍රදානය කරන ලද ණය පහසුකමක් සහිත කාඩ්පත් දරන්නා විසින් භාවිතා කරන ලද ණය මුදල සම්පූර්ණයෙන් හෝ කොටසක් නියමිත දින හෝ ඊට පෙර ගෙවා නිම කළහැකි කාඩ්පතක් අදහස් වේ. නියමිත දිනට නොපියවන ලද ණය මුදලට නිකුත් කරන්නා විසින් පොලී හෝ වෙනත් ගාස්තු අය කරනු ලැබිය හැකිය.

(v) "**පෞද්ගලික**" යන්නෙන් කාඩ්පත් හිමියාගේ, ඔහුගේ/ඇයගේ කලත්‍රයාගේ, ළමයින්ගේ සහ දෙමාපියන්ගේ ප්‍රයෝජනය සඳහා භාවිතා කිරීම අදහස් වන අතර එමගින් කාඩ්පත යම් වාණිජ කාර්යයක් සඳහා භාවිතා කිරීම අදහස් නොවේ.

9. 2005 සැප්තැම්බර් 19 වැනි දින අංක 1411/5, 2012 දෙසැම්බර් 20 වැනි දින අංක 1789/34 සහ 2014 මැයි 28 වැනි දින අංක 1864/40 දරන අති විශෙෂ ගැසට් පත්‍රයන්හි පළකරන ලද දැන්වීම් මෙයින් අවලංගු කරනු ලැබේ.

ටී. එම්. ජේ. වයි. පී. ප්‍රනාන්දු,
විනිමය පාලක.

2016 ජනවාරි මස 20 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ දී ය.

03 - 268

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.